# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.02.11 පැය 1130 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/292/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**සැකකරුවෙකු අත්අඩංගුවට නොගන්නා ලෙස පොලිස් ස්ථානාධිපතිවරයෙකුට බලපෑම් කරන ලද සැකකරුවෙකු අත්අඩංගුවට.**

2024 වර්ෂයේදී මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු අත්අඩංගුවට නොගන්නා ලෙස නාත්තණ්ඩිය පොලිස් ස්ථානාධිපතිවරයාට පුද්ගලයෙකු විසින් දුරකථනයෙන් අමතා බලපෑම් කිරීමක් සම්බන්ධයෙන් නිකවැරටිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබිණි.

සිද්ධිය සම්බන්ධයෙන් ගල්ගමුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව මෙම බලපෑම් සිදු කළ සැකකරු වන අබේරත්න ලියනගේ සුරේෂ් ප්‍රියසාද් නොහොත් ඩෑන් ප්‍රියසාද් යන අයට එරෙහිව ගරු අධිකරණය මඟින් විදෙස් ගමන් තහනමක් නිකුත් කරන ලද අතර අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට නියෝගයක් ද නිකුත් කරන ලදී.

ඒ අනුව, 2025.02.11 වන අද දින උදෑසන කාලයේ ඩුබායි රාජ්‍යයේ සිට පැමිණීමේදී පොලිස් කණ්ඩායමක් විසින් කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේදී මෙම සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර වැඩිදුර විමර්ශන සඳහා නිකවැරටිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය වෙත භාර දීමට නියමිතය.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය